# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 39 දරන
# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 ඔක්තෝබර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 ඔක්තෝබර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 20 යි　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1982 අංක 39 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 ඔක්තෝබර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 70/81

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1982 අංක 39 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 243 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1979 අංක 15 දරන පනතේ 243 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) මහාධිකරණය ඉදිරියෙහි පැවැත්වෙන යම් නඩු විභාගයක දී හෝ එවැනි යම් නඩු විභාගයකට පෙර පවත්වනු ලබන පරීක්ෂණයේ දී හෝ අල්ලස් පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියෙහි පැවැත්වෙන යම් නඩු විභාගයක දී හෝ සාක්ෂිදීම පිණිස කැඳවනු ලැබූ තැනැත්තන් විසින් පැමිණ සිටීමෙහි ලා හා සාක්ෂි දීමෙහි ලා නැතහොත් ඊට ආනුෂංගිකව දරන ලද වියදම්, ඒ තැනැත්තන් වෙත ඒකාබද්ධ අරමුදලින් ගෙවීම සඳහා හා ඒ ගෙවීම්වලට ඉඩ දිය හැක්කේ යම් කොන්දේසි මත ද ඒ කොන්දේසි පිළිබඳව;".

ඒ 65029—14,975 (82/03

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නම් වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.